# ජාතික අධ්‍යාපන ආයතනය

# පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ පාඨමාලාව සහ

# පාසල් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2009/ 2010

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය මගින් මෙහෙයවන උක්ත පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## ❋ පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව

**පාඨමාලාවේ ස්වභාවය**

1. i. මෙම පාඨමාලාව එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාවකි.
   ii. අධ්‍යයන සැසි ජාතික අධ්‍යාපන ආයතනයේ මීපේ මධ්‍යස්ථානයේ දී පවත්වනු ලැබේ.
2. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන මෙම පාඨමාලාවට, ඉංග්‍රීසි, සිංහල හා දෙමළ යන ඕනෑම මාධ්‍යයකින් විභාගයට පෙනී සිටීමේ නිදහස අයදුම්කරුවන්ට ඇත.
3. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා නිර්දේශිත දෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා මෙම පාඨමාලාව වෘත්තීය සුදුසුකමක් සපයයි.

**අයදුම් කිරීම සඳහා සුදුසුකම්**

1. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ විදුහල්පති සේවයේ/ ගුරු අධ්‍යාපනඥ සේවයේ/ ගුරු සේවයේ I ශ්‍රේණියේ සාමාජිකයකු වීම හෝ පිළිගත් අධ්‍යාපන ආයතනයක ප්‍රධානියකු වීම.
2. පිළිගත් අධ්‍යාපන ආයතනයක අධ්‍යාපනවේදී උපාධිය හෝ වෙනත් උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව, පුහුණු ගුරු සහතිකය, ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව වැනි වෘත්තීය සුදුසුකමක් තිබීම.
3. අවුරුදු හතරක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම සහ ඉන් අවුරුදු දෙකක් පරිපාලන හා අධීක්ෂණ කටයුතුවල යෙදී තිබීම.

**පාඨමාලාව සඳහා තෝරා ගැනීම**

අධ්‍යාපන කළමනාකරණ සහ ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් කුසලතා යනුවෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් සහිත ප්‍රවේශ විභාගයකින් ඉහළ ලකුණු ලබන අය වෙනුවෙන් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව පාඨමාලාව සඳහා යුදුස්සන් තෝරාගනු ලැබේ.

ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු: 200/-

ඇතුළත් වීමේ විභාග ගාස්තු රු: 350/-

## ❋ පාසල් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව

**පාඨමාලාවේ ස්වභාවය**

1. සති අන්ත අධ්‍යයන සැසි යොදාගනිමින් පැවැත්වෙන මාස 18 ක පාඨමාලාවකි.
2. පාඨමාලාව ජාතික අධ්‍යාපන ආයතනයේ මීපේ මධ්‍යස්ථානයේ දී සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

**අයදුම් කිරීම සඳහා සුදුසුකම්**

1. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ විදුහල්පති සේවයේ/ ගුරු අධ්‍යාපනඥ සේවයේ/ ගුරු සේවයේ 1 හෝ 2 -1 ශ්‍රේණියේ/ තනතුරක් දැරීම හෝ පිළිගත් අධ්‍යාපන ආයතනයක ප්‍රධානියකු වීම.
2. අවුරුදු හතරක ඉගැන්වීමේ පළපුරුද්දක් හා අවම වශයෙන් එක් අවුරුද්දක පරිපාලන හා අධීක්ෂණ කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබීම.
3. 2009-06-30 දිනට වයස අවුරුදු 53 ට අඩු වීම.

**පාඨමාලාව සඳහා තෝරා ගැනීම**

1. අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පැය දෙකක ප්‍රශ්න පත්‍රයක් සහිත ප්‍රවේශ විභාගයකට පෙනී සිට ඉන් ඉහළ ලකුණු ලබන අය වෙනුවෙන් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.
2. ඉල්ලුම් පත්‍ර ගාස්තුව : රු. 200/-
   ඇතුළත්වීමේ විභාග ගාස්තුව : රු. 250/-

**පාඨමාලාවට ඉල්ලුම් කිරීම**

1. මෙහි පහත දැක්වෙන ආදර්ශය අනුව සකස් කළ අයදුම් පත්‍රයක් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් නමින් ලංකා බැංකුවේ ඕනෑම ප්‍රධාන ශාඛාවකින්, ගිණුම් අංක. 7041168 ට ඉහත අදාළ අයදුම්පත් හා ඇතුළත් වීමේ විභාග ගාස්තු බැර කොට ලබාගත් ලදු පත සමග සහකාර අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යාපන නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය, ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඔබගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වුවහොත් ඉල්ලුම්පත් ගාස්තුව සහ ඇතුළත් වීමේ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.
2. ඔබ ඉල්ලුම් කරන පාඨමාලාවේ නම ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.
3. 2009-06-30 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වේ.

**මහාචාර්ය ලාල් පෙරේරා,**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**